# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## කර්මාන්ත අමාත්‍යාංශය

# පුරප්පාඩු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකාවේ කාර්මික අංශය දිරිගැන්වීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ වගකීම පවරන ලද 1969 අංක 36 දරන පනතින් පිහිටුවන ලද ප්‍රමුඛ රාජ්‍ය අංශයේ ආයතනය වේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ පවතින පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ අපේක්ෂකයන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරු - පුරප්පාඩු**

| අංකය | තනතුරේ නම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කාණ්ඩය |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ මූල්‍ය | 01 | HM1-2 |
| 2 | ගණකාධිකාරී | 01 | MM1-2 |

**02. අයදුම් කිරීමේ ක්‍රමය :**

සියලුම අනෙකුත් අදාළ තොරතුරු හා විස්තර කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) www.idb.gov.lk යන නිල අඩවියෙන් භාගත කරගත හැකිය.

**03. ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ**

- උපයෝගී කොට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම
- සේවක හා පවුලේ සාමාජිකයන් ආවරණය වන පරිදි වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PEDI/2015 පරිදි HM කාණ්ඩය සඳහා ප්‍රවාහන පහසුකම් හෝ දීමනා ලබාදෙනු ලැබේ.
- වාර්ෂික පාරිතෝෂිතය
- සහනදායි පොලී අනුපාතය මත ආපදා ණය
- අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය

**04. රැකියාවේ නියුක්ත කිරීම සඳහා වන පොදු කොන්දේසි**

1. මෙම තනතුරු ස්ථිරයි.
2. මෙම තනතුරට තෝරාගනු ලබන අපේක්ෂකට සේවක අර්ථසාධක අරමුදල සඳහා හිමිකම් ඇති අතර, සේවකයාගේ දායකත්වය 10% කි. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා මණ්ඩලය විසින් පිළිවෙලින් 12% ක් හා 3% ක දායකත්වයක් ලබාදෙනු ලැබේ.
3. අයදුම්පත්, උප්පැන්න, අධ්‍යාපන, වෘත්තීය හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමගින් ඉදිරිපත් කළ යුතුය. සුදුසුකම් හා පළපුරුද්ද සහ අදාළ පුද්ගලික දත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් පිළිබඳ සම්පූර්ණ විස්තර අඩංගු අයදුම්පත් 2021.07.19 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය.
4. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයන් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.
5. රාජ්‍ය සේවයේ/ සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයවලුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
6. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. අයථා බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සභාපති,**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය,**
**615, ගාලුපාර, කටුබැද්ද,**
**මොරටුව.**